# නූතන තොප්පිගල සහ එහි ඓතිහාසික උරුමය

**සේවාර්ජිත මහාචාර්ය එම්. ඩබ්ලිව්. විමල් විජේරත්න**

**(B.A. Hon' s First Class; M.A.; Ph.D.) විසිනි.**

මේ ලිපියේ අරමුණ ක්‍රි.පූ. තෙවෙනි සියවසේ සිට අද (2015) තෙක් තොප්පිගල ඓතිහාසික උරුමය හෙළි පෙහෙළි කිරීමය.

නැගෙනහිර පළාතේ මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරළේ පත්තුවේ (උතුර), පෙරිල්ලවේලි ග්‍රාමසේවක වසමේ තොප්පිගල පිහිටා ඇත. (සිතියම අංක 01 බලන්න)තොප්පිගල ගල මුදුනේ පිහිටීම :- උතුරු අක්ෂාංශ $7^0$ 50. 5, නැගෙනහිර දේශාංශ $81^0$ 23. 23, වේ.

ලොව අතිබිහිසුණු, තිස් අවුරුදු (ක්‍රි.ව. 1979 - 2009 මැයි 18) ඊළාම්වාදී කොටි ත්‍රස්තයන්ගේ සන්නද්ධ ගරිල්ලා අරගල සමයෙහි නැගෙනහිර පළාතේ මඩකලපු දිස්ත්‍රික්කයේ බටහිර සීමාවේ පිහිටි තොප්පිගල වූ කලී, එකී ත්‍රස්තයන්ගේ ගරිල්ලා යුද්ධ මෙහෙයුම් අතින් සුවිශේෂ වූ තැනක් ගත් පර්වතයකි. එය යථෝක්ත ස්ථානයේ පිහිටියේ වී නමුදු මුළු මහත් මඩකලපු දිස්ත්‍රික්කයට මතු නොව, යාබද පොළොන්නරු හා අම්පාර දිස්ත්‍රික්ක දෙකට ද එක සේ ගරිල්ලා මෙහෙයුම් දියත් කළ හැකි ආකාරයේ පිහිටීමකින් යුක්ත විය. තොප්පිගල පර්වත මස්තකයට නැග ගත් කල, එහි අවට ශේෂ පාෂාණ පද්ධතිය හැරුණ විට සතර දිග් භාගයේ බොහෝ ඈතට විහිද යන දීර්ඝ වූ පළල් වූ සුවිශාල තැනිතලාව හේතුවෙන්විශේෂයෙන් එකී පර්වත මස්තකයේත් අවටත් පිහිටුවා තිබූ කොටි ත්‍රස්තවාදී ගරිල්ලා මෙහෙයුම් ඒකක, ශ්‍රී ලාංකේය ධීර වීර රණවිරුවන් විසින් සිය අණසකට ගැනීම ලෝක ගරිල්ලා යුද්ධ ඉතිහාසයේ සුවිශේෂ සිද්ධියකි. කවර දිශාවකින් වුව ද ඒ පර්වතය දෙසට ගමන් කරන ඕනෑ ම අයකු ඈත සිට ඉතා පහසුවෙන් හඳුනා ගැනීමට එකී පර්වත ශීර්ෂයෙහි රැකවල්ලා සිටි කොටි ත්‍රස්තයන්ට නිරීක්ෂණය වූ නිසා ය. (ඡායාරූප අංක 01 බලන්න) එ හෙයින් තොප්පිගල ත්‍රස්ත කඳවුර යටත් කොට ගැන්මට එහි මෙහෙයුම් දියත් කළ ශ්‍රී ලංකා රණවිරුවන් කොපමණ සංඛ්‍යාවක් කොටි ත්‍රස්තයන්ගේ අමානුෂික වධ බන්ධනවලට, බිම් බෝම්බවලට, වෙඩි පහරවලට ලක්ව සදහට ම නෙත් පියා ගැනීමට ඇත්දැයි සිතාගත නො හැකි ය. තොප්පිගල පර්වතය යුද්ධ මෙහෙයුම් අතින් මර්ම ස්ථානයකි. එහි සිට උතුර, නැගෙනහිර, දකුණ, බස්නාහිර ප්‍රදේශවලට හමුදා මෙහෙයුම් දියත් කළ හැකි ය. චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ ලැබුණු දත්ත, දේශීය හා විදේශීය යුද්ධ උපදේශකයන්ගෙන් ලත් මඟ පෙන්වීම් මත මේ ස්ථානය තෝරා ගැනුණු බව නිසැක ය.

තොප්පිගල සිට සතර අතට දිග හැරෙන මහා තැනිතලාවෙන් ඉක්බිති එහි වටා මහා වන ගර්භ පිහිටියේ ය. එකී වන ගර්භයන්හී ස්ථානගත කළ කොටි පුහුණු කඳවුරු අදත්

දක්නට ලැබේ. ඒවා අද විවෘත සඤ්චාරක නිවාඩු නිකේතන බවට පත්කොට තිබීම (ඡායාරූප අංක 02 බලන්න)ශ්‍රී ලාංකේය යුද්ධ හමුදාවේ කාර්යක්ෂමතාව ප්‍රකට කරන්නකි. හිතවත් පිරිසක් සමග එහි ගොස් දවසක් දෙකක් ගත කිරීමට හැකි නම් මහා ඝන වනයක පවත්නා නිහඬ ස්වාභාවික සෞන්දර්යය අත්දැකිය හැකි ය.

එදා තොප්පිගල මුදා ගැනීමේ දී චතුර්විධ හමුදාවන්ගේ මිය ගිය රණ විරුවන් සිහිපත් වීමට තොප්පිගල පර්වත පාදයෙහි ගොඩනඟා ඇති නිර්මාණාත්මක යුද්ධ ස්මාරකයකි. (ඡායා රූප අංක 03 බලන්න) එයට සමීප ව යුද්ධ කෞතුකාගාරය ද පිහිටුවා තිබේ. ගරිල්ලා හමුදාවකට නිසි සේ මුහුණ දීමට බෙහෙවින් පුරුදු පුහුණු වූ රණවිරු සෙබළුන් ගේ ස්වාභාවිකවරණයෙන් යුතු කැළෑ සන්නද්ධ ගරිල්ලා යුද්ධ කඤ්චුකය ඇඳ සිටින රණවිරු සෙබළාගේ නිර්මිත රුව එහි අපූරු දසුනක් මවයි.

තොප්පිගල නැරඹීමට යන සඤ්චාරකයනට එහි නවාතැන් ගැනීමට පහසුකම් යුද හමුදාවෙන් ද සැපයේ. එවැනි සඤ්චාරකයන් අට දෙනෙකුට සුවසේ නවාතැන් ගත හැකි එහි වූ නිවාඩු නිකේතනය ඉතා විධිමත් ය; පිරිසිදු ය; තොප්පිගල තාරාවි කුළම් වැව ආසන්නයේ එය පිහිටුවා තිබීමෙන් නිශ්ශබ්ද වූ සොඳුරු පරිසරයක් එයට හිමි ය. උදය දිවා රාත්‍රී ආහාර පාන ද එතැනින් සැපයේ. සේවක මණ්ඩලය ආචාර සම්පන්න ය; විනීත ය. තොප්පිගලට යන මහා මාර්ග ද අතුරු මාර්ග ද කාපට් අතුරා සංවර්ධිත හෙයින් එහි යාම මහත් සතුටක් උපදවයි.

තොප්පිගල පර්වතය ගංගා, අතු ගංගා, ඇළවල්වලින් සුපරිවාරිත ය. එහි එකී ජල මාර්ග හරස් කොට බැඳි වැව් සත (07) කි. තොප්පිගල පර්වතයට කි.මි. 03 ක් නිරිත දිගින් එක් අතු ගංගාවක් ද එකී අතු ගංගාවෙන් කි.මී. 1/2 ක් නිරිත දිගින් සුවිශාල නදියක් ද යළි තොප්පිගල පර්වතයෙන් කි.මී. 01 ක් බටහිරින් අතු ගංගාවක් ද කි.මී. 1 1/2 ක් නැගෙනහිරින් අතු ගංගාවක් දැයි මෙසේ ස්වාභාවික ජල මාර්ගවලින් තොප්පිගල පර්වත ප්‍රදේශය සුපෝෂිත ය.

තොප්පිගල පර්වතයෙන් කි.මී. 1/2 ක් ඊසාන දෙසින් කුඩිම්බිමලේ වැව ද, කි.මී. 1 3/4 ක් ඊසාන දිගින් පුලියන්කුළම් වැව ද කි.මි. 1 1/2 ක් නැගෙනහිරින් මීරනකඩ්ඩව කුළම් වැව ද කි.මි. 04 ක් ගිනිකොනින් තාරාවි කුළම් වැව (මේ වැව සමීපයේ යුද හමුදා සඤ්චාරක නිවාඩු නිකේතනය පිහිටියේ ය) ද කි.මී. 03 ක් නිරිත දිගින් මීයන්කල් කුළම් වැව ද කි.මි. 1/2 ක් බටහිරින් අර්තිකාඩු කුළම් වැව ද කි.මී. 01 ක් උතුරින් මුතන් කුළම් වැව ද යන මේ සප්තවාපීහූ (07) තොප්පිගල පර්වතය වට කොට සිටියාහු ය. (සිතියම අංක 02 බලන්න)

තොප්පිගල පර්වතයට කි.මි. 17 ක් (සැතපුම් 11ක් පමණ) බටහිරින් මාදුරු ඔය ද එකී ඔය, එකකින් අනතුරු ව තවෙකක් පිහිටි සප්ත පර්වත දාමයෙහි, ක්‍රි.පූ. තෙවෙනි සියවසට අයත් පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි සහිත ගල් ලෙන් සිය ගණනක් ඉක්ම වූ දනාගල කඳු පෙළෙහි අවසනට පිහිටි කඳු දෙක අතරට පැමිණි පසු එකී කඳු දෙක අතරේ ඍජු රේඛාවක වූ මීටර්

100 ක් තරමේ අවකාශය ශක්තිමත් බැම්මකින් ආවරණය කිරීමෙන් ගොඩනැගූ සුප්‍රසිද්ධ මාදුරු ඔය ජලාශය ද මාදුරු ඔයෙන් යළි කි.මී. 17 ක් (සැතපුම් 11 ක් පමණ) බටහිරින් එයට බොහෝ දුරට සමාන්තරව මහවැලි ගඟ ද පිහිටියේ ය. මෙසේ භූ සිතියම් ද අහස් ඡායාරූප ද අධ්‍යයනය කළ විට පෙනෙන්නේ තොප්පිගල පරිසරය අතිදැවැන්ත කෘෂි කාර්මික ප්‍රදේශයක් වන බව ය. එය ගව පාලනයට අවශ්‍ය තෘණ භූමියෙන් ද යුක්ත ය. ඓතිහාසික යුගයේ දී මේ ප්‍රදේශය මහත් වූ ජනගහන සනත්වයකින් යුක්ත වූ බවට සාධක අදට ද එහි ශේෂ වී පවතී. තොප්පිගල ප්‍රදේශයෙහි මහා තැනිතලාවෙන් උඩට මතුවන ශේෂ පාෂාණ පද්ධතිය, බෞද්ධ භික්ෂූන් විසූ ගල් ලෙන්වලින් ද නටබුන් දාගැබ්වලින් ද බෞද්ධ විහාර සතු අවශේෂ වාස්තු විද්‍යාත්මක නෂ්ටාවශේෂයන්ගෙන් ද ගහන ය. නෙලුගල, කුවිදාගල, තලවාගල ආදී නම්වලින් වත්මනෙහි හැඳින්වෙන ගල් පර්වත සිසාරා ඉපැරණි බෞද්ධ ආරාමවල නටබුන් විසිරී පවතී. එවක මේ සංඝාරාමවල සිය දහස් ගණන් භික්ෂූන් සහ භික්ෂුණීන් විසූ බව එකී ආරාමවල පැතිරුණු ස්වරූපයෙන් පැහැදිලි වෙයි. තොප්පිගල මහා තැනිතලා භූමියත් වගුරු බිමත් කෘෂිකාර්මික කටයුතු සඳහාත් ගම්මාන ඉදිකර ගැනීම සඳහාත් පෙර දවස යොදා ගැනුණු බව නිසැක ය. යථෝක්ත ආරාමවල වැඩ විසූ අනේක සහස්‍ර භික්ෂු භික්ෂුණීන් සුපෝෂිත වූයේ ඉහත සඳහන් කෘෂි කාර්මික ප්‍රදේශයේ පදිංචි ව විසූ ශ්‍රද්ධාවන්ත බෞද්ධ ජනයා විසිනි.

තොප්පිගල පර්වතය වූ කලි සුවිශේෂ හැඩයකින් යුක්ත ය. මේ ලිපියේ වර්තමාන ලේඛකයා ගේ අත්දැකීම අනුව මෙවන් වූ අනන්‍යතා ස්වරූපයෙන් යුතු පර්වතයක් තොප්පිගල මුත් ලක්දිව අන් තැනකින් හමු නොවේ. මේ පර්වතයේ මේ සුවිශේෂ හැඩය ක්‍රි.ව. 19 වන ශතකයේ දී සුදු ජාතික බැරන් මහතා ප්‍රත්‍යක්ෂ කර ගත්තේ තොප්පියක ආකෘතියෙනි. එහෙයින් හෙතෙම එය සිය නම ද එකතු කොට එය ,ඊ්ර්බ්. ඝ්ච, යි නම් කෙළේ ය. එහි සිංහල අනුවර්තනය 'තොප්පිගල' නමින් ප්‍රසිද්ධ වූයේ ය. එය නිසැකව ම අලුත් නමකි. තව ද තොප්පිගල පෙදෙසේ වැසි දමිළ ජනතාව විසින් පාරම්පරික ව එය ''කුඩුම්බිමලේ''යි එය ඔවුනට දර්ශනය වූ හැටියෙන් හැඳින්විණ. මේ කුඩුම්බිමලේ යනු කුමන අභය භූමියේ පිහිටි කුඩුම්බිගලෙන් සම්පූර්ණයෙන්ම වෙනස් වූ අන් පර්වතයකි. කුමන පිහිටි කුඩුම්බිගල යනු රෝහණ ජනපදයේ, ක්‍රි.පූ. දෙවන ශතකයේ පාලකයා වූ ගෝඨාභය රජු විසින් ගොඩනැගූ චේතිය පබ්බත/ගිරි විහාරය බව නිශ්චය කොට ඇත.[1]

තොප්පිගල පර්වත මස්තකයේ අතිපෞරාණික බෞද්ධ විහාරයක් සතු නෂ්ටාවශේෂ දාගැබක් වෙයි. එහි වූ ඉපැරණි ගඩොළු, පර්වත මුදුනේ විසිරී පවතී. (ඡායාරූප අංක 04, 05, 06 බලන්න). ඒ චෛත්‍යය සතු වූ ශිලා කර්මාන්ත ද ශේෂ වී තිබේ. මේ නටබුන් දාගැබට නුදුරෙහිසමාන දිග පළලින් යුතු අවකාශයක ස්වාභාවික ගලේ කෙටූ කුහර සතරකි. මේ වූ කලී අතීතයේ එතැන ඉදි වූ කුඩා ගොඩනැගිල්ලක වහලය දරා සිටි කණු, පොළොවට සවි වූ ගල් වළවල් ය. (ඡායාරූප අංක 07 බලන්න) මේ පර්වතය මුදුනේත් එයට සමීප බෑවුමේත් ගල් ලෙන් දහයක් පමණ බිමට පහත් වී ඇති ආකාරය කෙසේද යත් ඒ පිළිබඳ හරි හැටි කරුණු නොදත් අයෙකුට ඒවා ඉපැරණි ගල් ලෙන්වල අදට විද්‍යමාන ස්වරූප බව තේරුම් නොයනු ඇත. (ඡායාරූපඅංක 08, 09, 10 බලන්න)තොප්පිගල පර්වත බෑවුම්වල නටබුන් ව

පෙර පිහිටුවා තිබූ තැන්වලින් තල්ලු වී පර්වතයේ පහළට තල්ලු වෙමින් පවත්නා ඉපැරණි ශිලා කර්මාන්ත ශේෂ විද්‍යමාන වේ. ඒ අතර කැටයම් නැති, ක්‍රි.පූ. යුගයට අයත් වන සඳකඩ පහණ ද ඇත. (ඡායා රූප අංක 11, 12 බලන්න)

තොප්පිගල පර්වත මුදනේ පවත්නා පරිසරය සංසාර විමුක්තිය පතන යෝගාවචරයකුට කාය විවේකය ද චිත්ත විවේකය ද සපය යි. විසුද්ධිමග්ගයේ සඳහන් විතක්ක චරිතයාට භාවනා වැඩීමට උචිත පරිසරයක් එහි පවතී. පර්වත මස්තකයේ සිට පහළ තැනිතලාවට නෙත් යොමු කළ විට පෙනෙන දර්ශනය එයට හේතුව යි. ඇස ගැටෙන අරමුණ, දැකීම් මාත්‍රයෙන් ම නැවතීම (''දිට්ඨෙ දිට්ඨමත්තං'') සිදුවෙයි. බෑවුම් ආකාර නැඟීමකින් අනතුරු ව තොප්පිගල පර්වතය ඍජු බිත්තියක් සෙයින් ලම්බාකාර ව අහසට නඟී. එය නැඟීම අතිදුෂ්කරය. මේ ලිපියේ වර්තමාන ලේඛකයා ඒ ලම්බාකාර ගල් ශිඛරය නැංගේ යුද හමුදා නිලධාරීන්ගේ හා වීර සෙබළුන්ගේ උපකාරයෙනි.

තොප්පිගල පර්වතය කි.මී. ගණනාවක් ඈතින්, විවිධ පෙදෙස්වලට දිස්වෙයි. ඇතැම්විට එය, කි.මී. 15 ක්, කි.මී. 17 ක් හෝ කි.මී. 30 ක් පමණ ඈතට සුපැහැදිලි ව දර්ශනය වෙයි. ඒ ඓතිහාසික යුගයේ මේ පර්වත මස්තකයේ පැවති ශ්වේත වර්ණ චෛත්‍යයේ යථෝක්තාකාරයෙන් ඈතට සිදු වූ දර්ශනය කෙතරම් මනස්කාන්ත වන්නට ඇද්දැයි සිතේ. වර්තමානයේ (2015) ලක්දිවට උදා වූ නව දේශපාලනික පසුබිමට අනුව, ජාති, භාෂා, ආගම් ආදී භේදයෙන් ඉවත් ව මුස්ලිම්, දමිළ, සිංහල ප්‍රජාව සහෝදරත්වයෙන් ශ්‍රී ලාංකේය ජාතිය බවට අනුවර්තනයව සියල්ලන්ගේ උපකාරයෙන් තොප්පිගල මේ ඓතිහාසික චෛත්‍යය යළි ගොඩනංවා මේ එකමුතු ව දාගැබක ස්වරූපයෙන් ඈතට දර්ශනය වීමට කටයුතු සලස්වනු ඇතැ යි මේ ලිපියේ වර්තමාන කතුවරයා අපේක්ෂා කරයි. බොහෝ ඈතට තොප්පිගල දර්ශනය වන බව මෙහි සඳහන් විය. එයට නිදර්ශන මෙසේ ය. අනුරාධපුර - මරදන්කඩවල - හබරණ - පොළොන්නරුව - මනම්පිටිය සහ ත්‍රිකුණාමඩු හරහා මඩකලපුවට යන මහා මාර්ගයේ මනම්පිටියෙන් පසු හමුවන කඩවත මඩුව, වැලිකන්ද, පූනානී යන පෙදෙස්වලින් ගමන් කරද්දී දකුණත පැත්තෙන් කි.මී. 15 ක් පමණ වූ ඍජු දුරකින් තොප්පිගල මැනවින් දර්ශනය වෙයි. යළි එකී මාර්ගයේ ම මඩකලපුවට ගමන් කරන විට මඩකලපුවේ පිහිටි සතුරුකොණ්ඩවාන් කලපුවට දකුණු පැත්තෙන් කි.මී. 30 ක් පමණ ඍජු දුරකින් තොප්පිගල මැනවින් පෙනේ. තව ද මනම්පිටිය, මඩකලපු හන්දිය, අරලගංවිල, දම්මින්න, කන්දේගම, මාදුරු ඔය ජාතික වනෝද්‍යානය අතරින් මහඔය හැටනවය හන්දිය හරහා අම්පාරට දිවෙන මහා මාර්ගයේ පෙර සඳහන් කළ දම්මින්න පෙදෙසේ දී ඊසාන දෙසින් යළි තොප්පිගල දර්ශනය වෙයි. එකී මාර්ගයේ දම්මින්නෙන් පසු හමුවෙන කන්දේගම පෞරාණික ධනඤ්ජය රජ මහා විහාරයේ දනාගල කඳු මුදුනට ද කි.මී. 17 ක් පමණ ඍජු දුරකින් ඊසාන දෙසින් ද යළි තොප්පිගල පෙනේ. මෙ පරිදි තොප්පිගල අවට පිහිටි කවර මාර්ගයකින් ගමන් ගත්ත ද තොප්පිගල ඇස ගැටෙයි. මේ නිසා තොප්පිගල වූ කලී නූතනයේ මතු නොව අතිපෞරාණික යුගවල දී ද ලක්දිව් වැසියන්ගේ මනා අවධානය තමා වෙත ආකර්ෂණය කර ගැනීමට සමත් වූ ස්වභාව ධර්මයේ අපූර්වතම නිර්මාණයකි. එහෙයින් ඒ ඓතිහාසික යුගවල දී හෙළදිව් වැසියන් මහත් අවධානයකින් යුතු

ව එකී පර්වතයේ ස්වරූපයට අනුරූප වූ සුන්දර නාම ව්‍යවහාරයක් එයට නිසැකව ම තබන්නට ඇත. එම නාමය, වර්තමානයේ දී මුළුමනින් ම ඉවත් ව ගොස් ය. අතිශයින් පීඩාකාරී වූ මාඝාදී විදේශීය පරසතුරු ආක්‍රමණවල ද මැලේරියාවේ ද ප්‍රතිඵල ලෙස තොප්පිගල ප්‍රදේශයේ, දහතුන්වැනි (13) සියවසට පෙර ජීවත් වූ පීඩිත සිංහලයන්, අතින් ගෙන යාහැකි වස්තුවක් ගෙන තම නිජ බිම මහත් ශෝකයෙන් අත්හැර දිවි රැක ගැනුමට දිවයිනේ අන් පෙදෙස්වලට පලා ගිය බව නිසැක ය. එහෙයින් තොප්පිගල ඓතිහාසික නාමය ද හෙළදිව් වැසියන් ගේ මතකයෙන් ඉවත් විය.

මේ ලිපියේ අරමුණ වනාහි මතකයෙන් ඉවත් වුණු තොප්පිගලේත් එකී ප්‍රදේශයේත් යථෝක්ත ඓතිහාසික නාම, එහි භූ විෂමතා ලක්ෂණ, ශිලා ලිපි, සාහිත්‍ය මූලාශ්‍රය පදනම් කොට ගනිමින් අනාවරණය කරගැනීමත් එකී ප්‍රදේශයේ පුරාතනයේ පැවති දේශීය උරුමය යළි හෙළි පෙහෙළි කිරීමත් ය.

මේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට මූලාශ්‍රය කරගත හැකි අතිපෞරාණික කථා වස්තුවක් ක්‍රි.ව. සතරවන සියවසේ පමණ රචිත සීහළවත්ථුප්පකරණය, ක්‍රි.ව. දහවන සියවසේ දී පමණ රචිත සහස්සවත්ථුප්පකරණය, ක්‍රි.ව. දහතුන්වන ශතකයේ රචිත රසවාහිනිය යන පාළි ග්‍රන්ථවල ද ක්‍රි.ව. දහහතරවන ශතකයේ රචිත සිංහල ග්‍රන්ථයක් වන සද්ධර්මාලංකාරයේද ඇතුළත් වේ. මේ පාළි සිංහල ග්‍රන්ථ ඇසුරු කරගනිමින් එකී කථා වස්තුව හුදී ජන පහන් සංවේගය ජනනය කරනු පිණිස ද නූතන සිංහල බසට මෙ පරිදි අනුවර්තනය කෙරේ.

ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ පරිනිර්වාණයෙන් පසු එනම් ක්‍රි.පූ. හයවන (06) සියවසෙන් පසු, ශ්‍රී ලංකා ද්වීපයෙහි ගඞ්ගා තීරයෙහි පිහිටි පූව පබ්බත - පූවගාලක - පූවගල්ලක - පූගලු නම් ගමෙහි එක්තරා කුල ගෙයක වෙසෙන දෙමාපිය කෙනෙකුනට පුත් කුමරෙක් උපන. දෙමාපියෝ ඔහුට තිස්ස යයි නම් තැබූහ. ඒ තිස්සයෝ ද අනුක්‍රමයෙන් වැඩෙන්නාහු තුරුණු වියට එළඹ ප්‍රියමනාප වූ යුවතියක ආවාහ කොට ගත්තාහු සිය බිරිය සමග යථොක්ත ගමෙහි සතුටින් විසූහ. මේ තිස්සයෝ පසු කලෙක ඒ ගමෙහි වූ පූව පබ්බත විහාරයට ගියාහු එහි පැවති දම් දෙසුමකට සවන් දුන්නෝ සසර බිය ද ගිහි ගෙයි ආදීනව ද අභිනිෂ්ක්‍රමණයෙහි - පැවිද්දෙහි - අනුසස් ද අසා සිය බිරිය, නෑසියන් ගෙන් පැවිද්දට අවසරය ගෙන පූව පබ්බත - පූවගාලක - පූවගල්ලක - පූගලු නම් විහාරයට ගොස් එහි විසූ භික්ෂු සංඝයාට වැඳ ආරාධනා කොට, ඔවුන් වහන්සේලාගෙන් මහණ උපසම්පදාව ලැබුවාහු ය.

මෙසේ සසර බිය දැක ගිහි ගෙයි කලකිරී අවංක ව සසුන්ගත වූ තිස්සයෝ බුද්ධානුබුද්ධක ශික්ෂා පදයෙහි පවා නිරතුරුව සැලකිලිමත්වූවාහු එහෙයින් ම සමාධිගත වූ සිතින් විපස්සනාවට නමා ගත් තිර අදිටනින් දිවා රාත්‍රියෙහි භාවනා වඩන්නාහු නොබෝ කලකින් සියලු කෙලෙසුන් සහමුලින් උදුරා දමා රහත් බවට පැමිණියාහු ය; අග්‍ර දක්ෂිණීය

වූවාහු ය; තෙවළා බුදු වදන්හි බැස ගත් ගැඹුරු වූ ප්‍රඥාපාටවය සහිත වූවෝ 'පූගලු වැසි තිස්ස මහ රහතන් වහන්සේ' යැයි මුළු ලක්දිව සුපතළ බවට පැමිණියාහු ය.

ඒ තිස්ස මහරහතුන් ගේ පාත්‍රය, යම්කිසි ඉසුරුමත් කෙනෙක් වත් දිළින්දෙක්වත් ගත්තාහු වී නම් ඔහු උන්වහන්සේට සුවඳ ගිතෙල් මුසු මොනර මස් සමග රත් ඇල් සාල් බත් ම පුරා දෙති.

මෙසේ පිළිවෙළින් සැට හවුරුද්දක් ඉක්මුණු කල්හී එක් දිනක, තිස්ස මහ රජුන් ගේ තිස්ස නමැති අමාත්‍යවරයෙක් සිතන්නේ 'මේ තෙරුන් වහන්ස්ට හැම දවස්ම සුවඳ ගිතෙල් මුසු මොනර මස් හා සමග රත් හැල් සාලේ බත් ම උපදෙනේ යයි බොහෝ දෙන ම කියති. මා විසින් මේ කාරණය සුපරීක්ෂා කළ මැනවැ යි සිතා තමා ගේ ගෙට ගොස් රාත්‍රියෙහි සිය බිරියට කියනුයේ 'එම්බා සොඳුර, සෙට දවස් මම, පූගලැ වසන තිස්ස මහ තෙරුන් වහන්සේට දනක් දෙනු කැමැත්තෙමි. තෙරුන් වහන්සේ අපගේ ගෙට වැඩි කල්හි නිවුඩු සාලින් කුඩු මුසු කැඳක් පිස වළඳවා වේලා ආසන්න වූ කල්හි පලා මාළුවක් හා කාඩි ඇඹුල් දෙවනු කොට නිවුඩු සාලේ බත් වළඳවා ලවයි විධාන කොට ඒ රාත්‍රිය පහන් වූ කල්හි පූගලු විහාරයට ගොස් ඒ තිස්ස මහ තෙරුන් වහන්සේ වැඳ, ''ස්වාමීනි, අද මට අනුග්‍රහ කළ මැනවැ'' යි ආරාධනා කොට තුමූ කිසි කාරියෙකැ ගියා සේ අනික් තෙනකට ගියාහු ය.

ඉක්බිති අමාත්‍යවරයාගේ ගෙයි වසන දේවතාවෙක්, රාත්‍රී භාගයෙහි බිරිය හා සමග කථා කරන්නා වූ අමාත්‍යවරයාගේ බස් අසා 'මූ හැම, මේ තෙරුන් වහන්සේ පූර්ව ජන්මයෙහි කළා වූ කුශලය හා ප්‍රාර්ථනා බලයෙන් සිදු වන විපාක සුවිශේෂය, කිසි කෙනකුන් විසින් නොවැළැක්විය හැකි බව තමන් ගේ දිව්‍ය ඥානයක් නැති හෙයින් නො දත්තාහු ම යයි සිතා, එම ගෙයි වසන මහලු මිනිසකු සැටියෙන් වෙස් වලා, සුවඳ ගිතෙල් බඳුනක් ද මොනර මස් ද රත් හැල් සාල් ද යන සියල්ල ම ඇර ගෙන ගෙට අවුත් ඇමතිවරයාගේ බිරිඳට දින. ''මේ කොයින් ගෙනවු දැ යි විචාළවුන්ට ''එම්බා මැණියෙනි, නුඹ ගේ හිමි වූ අමාත්‍යවරයාණෝ, අතර මග මා දැක, ''එම්බල, අද මම, පූගලැ වසන තිස්ස මහ තෙරුන් වහන්සේට දනට ආරාධනා කෙළෙමි. තෙපි, මේ දානෝපකරණ ගෙන මගේ ගෙට ගොස් මාගේ බිරියට දී කියන කලැ, මෙයින් ඉඳුරා බත් මාළු පිස තෙරුන් වහන්සේ වළඳවාලන්ට කියාලවයි'' මා අතැ මේ හැම එවුවාහු යයි කියා දේවතාවා අතුරුදහන් විය.

අමාත්‍යවරයාගේ බිරිය ද එ පවත් අසා ඉඳුරා එයින් බත් මාළු පිස තබා තෙරුන් වහන්සේ වැඩි කල්හි පාත්‍රය ගෙන හිඳිනා අසුන් පනවා වැඩ හුන් කල්හි සුවඳ ගිතෙල් හා මොනර මසින් යුක්ත වූ සුවඳ රත් හැල් සාලේ බත වැළඳවූවා ය. තෙරුන් වහන්සේ වළඳා අනතුරුව විහාරයට ම වැඩි සේක. ඉක්බිති අමාත්‍යවරයා සිය ගෙට අවුත් ''අද තෙරුන් වහන්සේට දන්දුනුදැයි භාර්යාවගෙන් විමසීය. එකලැ භාර්යාව ''නුඹ එවූ ගිතෙල් හා මොනර මස් ද රත් හැල් සාල් ආදී උපකරණයෙන් බත් මාළු පිස, තෙරුන් වහන්සේ වැළඳවීමි යි කී කල්හි, අමාත්‍යවරයා ''සොඳුර, මා එවු උපකරණයෙක් නැත. ඒ ගෙනාවෝ කවරහුදැයි විචාළේය. අප ගේ ගෙයි අසවල් මහලු මිනිසාණෝ වේ ද ගෙනාවෝ යයි කී කල්හි, ඒ මහලු

මිනිසා ගෙන් විචාළේ ය. ඒ පුරුෂයා විසිනුත් එසේ වූ දෙයක් මා ගෙනායේ නැතැ යි කී කල්හි, ඒ අමාත්‍යයාණෝ තෙරුන් වහන්සේගේ කුශලානුභාවයෙන් දෙවියන් කළ දෙයක් ම යයි සිතා, දන් පින් කළවුන් ලබන්නා වූ කුශල විපාකය කිසි කෙනකුන් විසිනුත් වැළැක්විය නොහැක්කැයි කියා බුදු සස්නෙහි පැහැද, එතැන් පටන් තමා ශක්ති පමණින් මහ දන් පවත්වා දානපති වූහ.

ඒ පූගලැ වෙහෙර වැසි තිස්ස මහ තෙරණුවෝ ජීවිතාන්තය තෙක් පින් බෙලෙන් ලබන ලද එ බඳු ආහාරය ම වළඳා කෙළවර පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපුණාහු පූගලු විහාරයෙහි සන්නිපාත භේරිය ගස්වා එ වෙහෙර වැසි සියලු භික්ෂූන් ද අවට විහාරවාසී භික්ෂූන් ද එහි රැස් කරවා තමන් වහන්සේ පිරිනිවන් පානා බව දන්වූවාහු ය. එකල එහි රැස් වූ භික්ෂූහු 'ස්වාමීනි, නුඹ වහන්සේ මහා පිනැති සේක. නුඹ වහන්සේ ගේ කුශල විශේෂය ලක්දිවැ හැම තන්හි ම සුපතළ විය. පූර්ව ජන්මයෙහි නුඹ වහන්සේ කවර නම් කුශලයක් කොට මෙ බඳු වූ අසිරිමත් ජීවිතයක් ලත් සේක් දැ යි විචාළ සේක. එ තෙපුල් ඇසූ තිස්ස මහ තෙරහු පූර්ව ජන්මයක තමන් වහන්සේ කළා වූ කුශලය කුමක්දැ යි ගෙන හැර දක්වන්නාහු 'මම, මේ මහා භද්‍ර කල්පයෙහි තුන්වැනි ව බුදු වූ කාශ්‍යප බුදුන් සමයෙහි රන්වන් වූ සිරියෙල් සුණු (රූපලාවණ්‍ය ද්‍රව්‍ය?)ගෙන වෙළඳාම් කොට ඒ ඒ තැනැ ඇවිදිනෙමි, මිල ගෙන එක් කුල කුමාරිකාවකට සිරියෙල් සුණු දිනිමි. ඇය, මා එ වේලා වන තෙක් ආහාරයක් අනුභව නො කළ බව දැන, මට වාඩි වීමට අසුන් දී අතට පැන් දී රත් හැල් සාලේ බතක් සමඟ සුවඳ සොඳ ගිතෙල් සමග මොනර මස් එළැවුව.

එකෙණෙහි සාදුකින් පෙළී ගිය එක් සුනඛයෙක් දෙ කොළින් කෙළ දහරා වගුරුවමින් අවුත් මා ඉදිරියෙහි බැගෑපත් ව මා දෙස බල බලා සිටියේ ය. ඒ සුනඛලා දැක කරුණාවෙන් කම්පිත වූ මම ගිතෙල් හා මොනර මස් එක් කොට මැනවින් හනා මහත් වූ බත් පිඩක් කොට එයින් ඒ සුනඛයා අනුභව කරවීමි. එ කලැ ඒ සුනඛයා ලබන ලද බල ඇති ව මහත් සතුටින් වලග සලමින් මාගේ මුහුණ බලා සිටියා දැක මම මහත් සේ සතුටු වීමි. තව ද එ වේලේ ඒ සුනඛයාට බත් දුන් කුශලයෙන් ඒ ජාතියෙහි පටන් උපනුපන් යම් ම ජාතියෙකැ සුවඳ ගිතෙල් මුසු මොනර මස් හා සමග කුඩු නො මැති වූ ඉතා නිර්මල වූ උතුම් රත් හැල් සාලේ බත් සැපසේ ම ලැබෙම්ව යි, මෙසේ කැමති කැමති සැපත් විඳ කෙළවර අමා මහ නිවන් දකිම්වයි පැතුයෙමි. ඒ මම, මෙ පමණ වූ අල්ප කුශලයක් කොට ජීවිතාවසානයෙහි චුති චිත්තයට අරමුණු වූ මේ කුසල් සිතින් මිය ගොස් දෙව් ලොව ඉපදුණෙමි. එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි අපමණ වූ දිව්‍ය සම්පත් විඳ එයින් චුත ව අවුත් මිනිස් ලොවැ පන්සියයක් ජාතියෙහි ඉපිද ඒ උපනුපන් ජාතියෙහි ගිතෙල් මුසු මොනර මස් හා සමඟ සුවඳ රත් හැල් සාලේ බත් ම ලද්දේ ය. ඉක්බිති අප ගේ ගෞතම බුදුරජාණන් වහන්සේ පිරිනිවි පසු, මම මේ ශ්‍රී ලංකා ද්වීපයෙහි ගංගා තීරයෙහි පිහිටි පූවපබ්බත/පූවගාලක/පූවගල්ලක/පූගලු/නම් ගමැ එක්තරා කුල ගෙයකැ ඉපදුණෙමි. මට තිස්ස යැයි නම් තැබිණ. යොවුන් වියට පැමිණි මම යුවතියක ආවාහ කොට ගත්තෙමි, ඇය හා ඉතා සතුටින් ගෘහ ජීවිතය ගෙව්වෙමි. මෙසේ කල් පසු වෙද්දී එක්තරා දිනක මම, පූවපබ්බත/ පූවගාලක/පූවගල්ලක/පූගලු විහාරයෙහි ධර්ම දේශනාවක් පැවැත්වෙන බව අසා,

එම විහාරයට ගොස් එක්තැන් වූ සිතින් ධර්ම ශ්‍රවණය කරමින් හුන්නෙම් සසර දුක දැක, ගිහි ගෙයි කල කිරී එකී විහාරයෙහි ම පැවිදි ව උපසම්පදා ව නිති සම්මා වායාමයෙන් සසුන් බඹසර හැසිරෙන්නෙම් නොබෝ කලකින් ම සියලු කෙලෙසුන් නසා නිවනට පැමිණියෙමි. මට යළි පුනර්භවයක් නැත. සසර ගෙවා අවසන් කරන අන්තිම ආත්ම භාවය මෙය යි.

මෙසේ මා විසින් පෙර කළා වූ මේ අල්ප කුශලය දැක එයින් මා ලැබූ අසිරිමත් විපාක ද දැක කුශලයෙහි අප්‍රමාදී වන සේ වදාරා, දනුදු යම් කෙනෙක් සත්ව හිංසනයෙන් මිදී, බලු කපුටු ආදී යම්කිසි තිරිසනක්හට කම්පල අදහා ඔවුන් ගේ කුසගන්නා පමණ ආහාරයක් දුන්නාහු නම් ඔහු මා සේ ම දිව්‍ය සම්පත්තිය මනුෂ්‍ය සම්පත්තිය නිවන් සම්පත්තිය යන ත්‍රිවිධ සම්පත්තිය සැප සේ ලබන්නාහු ම ය; තිරිසන් සත්ත්වයකුට මෙ බඳු දනක් දී මෙවන් සැපතක් ලත් කල බුද්ධාදී මහා සංඝරත්නය කෙරෙහි කම්පල අදහා දන් දීමෙන් ලැබිය හැකි ත්‍රිවිධ සම්පත් පිළිබඳ ව කවුරු නම් කියා නිමවා ගනිත් ද යි දේශනා කොට මෙසේ ඒ තිස්ස මහ රහත්හු භික්ෂු සංඝයා මධ්‍යයෙහි තමන් පෙර කළා වූ කුශල කර්මය ප්‍රකාශ කොට අවසන පූව පබ්බත විහාරයෙහි ම නිරුපධිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවියහ.[2]

මේ පූවපබ්බත විහාරය පිහිටියේ කොහි ද යි මේ දක්වා හඳුනාගෙන නැත.[3]

පූවපබ්බත විහාරවාසී තිස්ස මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකාද්වීපයෙහි ගඞ්ගාතීරෙ - ගඞ්ගා තීරයෙහි - පිහිටි පූවගාලක - පූවගල්ලක - පූගලු නම් ගමැ ඉපදුණු බව මේ කථා වස්තුවේ සඳහන් විය. එහි එම ගමෙහි නාමය පූවපබ්බතය යනුවෙන් එකී කථා ශීර්ෂයෙහිත් කථාවසානයේත් සඳහන් ය. එකී නාමය පුරාතන ඉන්දු ආර්ය භාෂාවට නැඟූ කල පූපපර්වත නම්. සංස්කෘත 'පූප', පාළි 'පූව', සිංහල 'පූ' යනු සාම්ප්‍රදායික කැවිලි වර්ගයක් වූ 'කැවුම්' ය. මේ බව ඉතා පැහැදිලිව නිශ්චය කෙරෙන සාධක ගණනාවක් සම්භාව්‍ය පාළි සිංහල ග්‍රන්ථවල දක්නා ලැබේ. ඒ සියල්ලක් මෙහි දැක්වීමට හැකි වුවත් මේ ලිපිය දීර්ඝවීම වළක්වා ගනු වස් එයින් තෝරා ගත් සුපැහැදිලි සාධක කීපයක් පමණක් මෙහි දැක්වීමට අපේක්ෂා කෙරේ. පෙර භවයක දී පතිනිය විසින් තමනට වෙන් කොට තැබූ කැවුම්, පිඬු සිඟා සිය නිවසට වැඩි පසේ බුදුන්ට ඇය විසින් පූජා කළ  බව අසා පසේ බුදුන් ලුහුබැඳ ගොස් උන්වහන්සේගේ පාත්‍රයට අත දමා කැවුම් පැහැර ගත් හේතුයෙන් බෝසත් කුස රජතුමාගේ මුහුණ පිච්චුණු හකුරු සේ දුඹුරුවන් විශාල කැවුමක් මෙන් වූ බව කුස ජාතකයේ සඳහන් ය. මේ පූව - කැවුම් -, පාළි ජාතකට්ඨකථාව (ක්‍රි.ව. 05 සියවස) සිංහල පන්සිය පණස් ජාතක පොත (ක්‍රි.ව. 14 වන සියවස) අලගියවන්න මුකවෙටිතුමාගේ කුස ජාතක කාව්‍යය (ක්‍රි.ව. 16 වන සියවස) යන ග්‍රන්ථවල විවිධ වූ ස්ථාන විසිහයක දක්නා ලැබේ. එකී ග්‍රන්ථවලින් එක් ග්‍රන්ථයකින් සාධක දෙක (02) බැගින් ග්‍රන්ථත්‍රයයෙන් අවස්ථා දෙකක් පමණක් උදාහරණ හැටියට මෙහි දැක්වේ. එහි දී පළමුව පාළි ජාතකට්ඨකථාවත් අනතුරුව සිංහල පන්සිය පණස් ජාතක පොතත් තදනන්තර ව අලගියවන්න මුකවෙටිතුමන් ගේ කුස ජාතක කාව්‍යයත් යන අනුපිළිවෙළට එකී සාධක මෙහි පෙළගස්වනු ලැබේ.

i. ''අහං කිං ඛාද්ස්සාමීති කුද්ධෝ පච්චේකබුද්ධං අනුගන්ත්වා පත්තතෝ පූවං ගණ්හි.''

ii. ''.... පාත්‍රයේ තිබූ කැවුම් ඇරගත්තු''.

iii. '' එ සඳෙහි ඔහුට ලද
පසේ මුනිඳුට මන නද
පූ කොටස තොප ලද
පුද කෙළෙමි පින් ගනුව කී සඳ

එ පවත් අසා ලා
තොප දෙ දෙන පූ කාලා
අප කොටස දීලා
හළෝ දූයි බෝ සේ කිපී ලා ''

i. ''අතිරසකපූවසණ්ඨානමුඛිං යක්ඛිණිං'' අග්ගමහේසිං කත්වා....''

ii. ''නුඹ වහන්සේ වැනි සකුරු පූවක් සේ දා හැලී ගිය මුහුණ ඇති යකින්නක අගමෙහෙසුන් කොට....''

iii. ''දෑ පූවක් ලෙස ට
විසුළු මුව යුත් මෙ ඔබ ට
යකින්නක් විලස ට
එක් ලියක් අගමෙහෙසිනිය කොට ''[4]

මේ නිදසුන්වලින් පැහැදිලි වන්නේ පාළි භාෂායෙහි ''පූව'' යනු වත්මන් සිංහලයෙහි (කොණ්ඩ) කැවුම් වන බව ය. මේ අනුව පූවපබ්බත - පූවගාලක - පූවගල්ලක - පූගලු යන යෙදුම්වලින් නිශ්චය වන්නේ :කොණ්ඩ කැවුමක් වැනි පර්වතයක් - ගලක් - එයින් කියවෙන බව යි. ''කොණ්ඩ කැවුම'' තොප්පිගල පර්වතයට බෙහෙවින් උචිත, අන්වර්ථ නාමයකි. මහා කොණ්ඩ කැවුමක් වැනි වූ පර්වතය - ගල - පූගල - යනු එයට නිසි අර්ථ විග්‍රහය යි. පාළි භාෂාවෙහි පූවපබ්බත / පූවගල්ලකාදී පද කම්මධාරය සමාසයෙහි ප්‍රභේදයක් වූ උපමාන පූර්ව පද සමාසයට අයත් ය. 'පූවෝ විය පබ්බතො පූවපබ්බතො' යනු එහි පාළි සමාස විග්‍රහය යි. එය සිංහලයෙහි පූවක් වැනි ගල 'පූගල' යී, විශේෂණ සමාසයෙහි උපමාන පූර්ව පද ප්‍රභේදයට අයත් වෙයි. තොප්පිගල පර්වතයේ පෙනුම සුවිශාල කොණ්ඩ කැවුමක ස්වරූපය වෙයි. (ඡායාරූප අංක13බලන්න)

සිංහල පාරම්පරික උරුමයෙහි කැවිලි වර්ග අතරින් කොණ්ඩ කැවුමට හිමි වන්නේ ප්‍රධාන ස්ථානයකි. එය නිවැරදි ව පිසිය හැක්කේ ද එයට නිසි සුවිශේෂ කුශලතා හා දීර්ඝ කාලීන පළපුරුද්ද ඇති අයට පමණි. උපත, කොටහළුව, විවාහය, මරණය යන ජීවිතයේ සංක්‍රාන්ති අවස්ථා සතරෙන් අවමංගල්‍ය අවස්ථාව වන මරණය හැර ඉතිරි මංගල්‍ය අවස්ථාත්‍රයේදී ම ප්‍රමුඛතම කැවිලි වර්ගය කැවුම් ය. මගුල් කෑම මේසයේ සතර කොනේ විශාල කැවුම් සතරක් පිහිටුවීම සිංහල ගැමි සම්ප්‍රදායයේ ලක්ෂණයකි. නව ගෘහ ප්‍රවේශයෙහි ද කැවුම් අනිවාර්ය ය. කිරි අම්මාවරුන්ගේ දානයේ දී ද කැවුම් සුවිශේෂ ස්ථානයක් ගනී. බුද්ධ ප්‍රමුඛ සාංඝික දානවල දී ද එය පූජෝපකරණයකි. සිංහල අලුත් අවුරුද්දේ සෑම සිංහල නිවසක ම පිසෙන ප්‍රමුඛතම කැවිලි වර්ගය කැවුම් ය. ලක්දිව ඇතැම් පෙදෙස්වල ඉපදුණු දරුවාගේත් ඒ දරුවා බිහි කළ මවගේත් ශරීර අලුතින් පිසූ කැවුමෙන් සම්බාහනය කෙරේ. උපන් දරුවාගේ ඉඳුල් කට ගෑමේ දී ද කැවුම් තබනු ලැබේ. ලක්දිව ඇතැම් සාම්ප්‍රදායික වැව් ගම්වල සෑම කුඹුරකින් ම නෙළා ගැනුණු අග්‍ර ශස්‍ය වී අස්වැන්නෙන් මිටක් බැගින් වූ වී ප්‍රමාණ සෑම නිවසකින්ම එකතු කොට පේවූ පිරිමින් විසින් වනේ ලා කොටා ලැබුණු පිටිවලින් ඔවුන් විසින් ම පිසනු ලබන විශාල කැවුමකින්, වැවට අරක් ගත් දේවතාවාට උත්සවශ්‍රීයෙන් පූජා කරන චාරිත්‍රයක් අද ද පවතී. මෙ පරිදි කැවුම් වූ කලි සිංහලයන්ගේ සුවිශේෂ සංස්කෘතික ආහාරයකි. චාරිත්‍ර විධිවල අනිවාර්ය අංගයකි. අභිචාර විධිවලට ද ශක්තිමත් බැම්මෙන් සුබන්ධිත ය. මේ අත්දැකීමෙන් යුතු, පෙර දවස ලක්දිව නිජ බිම් කරගත්තෝ තොප්පිගල පර්වතයේ කොණ්ඩ කැවුමක් වැනි වූ සුවිශේෂ ආකෘතිය දැක එයට අතිශයින් යෝග්‍ය වූ කැවුම්ගල - පූගල - යන නාමය තැබුවාහු ය. එය එකී ප්‍රදේශයේ වාසනාවේ සංකේතය වූයේ ය.

පූගලු තිස්ස මහ රහතුන්ගේ ඒ ඓතිහාසික විහාරය තොප්පිගල බව එකී පර්වතයේ ස්වරූප ලක්ෂණයෙන් මෙසේ අනාවරණය වෙද්දී එය තවදුරටත් තහවුරු කෙරෙන භූගෝලීය සාධකයක් එකී කථා වස්තුවේ දැක්වෙයි. එනම් පූගලු විහාරය ලක්දිව ගංගා තීරයෙහි පිහිටි බව සුපැහැදිලි ව සඳහන් වීමෙනි. ගංගා, මහා ගංගා, මහා නදී, මහාවාලුකා ගංගා යන නම් සියල්ලෙන් ම කියැවෙන්නේ වර්තමාන මහවැලි ගඟ බව විද්වතුන්ගේ නිගමනයයි.[5] මහවැලි ගඟට කි.මී. 31 ක් (සැතපුම් 19 1/2ක්) සෘජු දුර දකුණු දිසාවෙන් තොප්පිගල පර්වතය පිහිටියේ ය. එකී 'ගංගා තීරයෙහි' යි සඳහනින් මහවැලි ගඟ ඉන් අදහස් වුණේ යයි ද ගැනීමෙහි වරදක් නැත. තොප්පිගලට සමීප සුප්‍රසිද්ධ මහා ගංගාව එය වන බැවින. ඒ එසේ වුව ද මහවැලි ගඟෙන් සෘජු දුර කි.මී. 14 ක් දක්ෂිණ පාර්ශ්වයෙහි, මහවැලි ගඟට බෙහෙවින් සමාන්තර ව මාදුරු ඔය ද ගලා බසී. මාදුරු ඔයේ සෘජු දුර දක්ෂිණ පාර්ශ්වයෙහි කි.මී. 17 ක් (සැතපුම් 09) ක් පමණ තැන තොප්පිගිල පිහිටියේ ය. මේ අනුව මහවැලි ගඟට සාපේක්ෂව බලද්දී තොප්පිගලට වඩාත් සමීප ව ගලා බසින්නේ මාදුරු ඔය යි. මාදුරු ඔයේ ඓතිහාසික නාමය කුමක් වීදැයි මෙතෙක් නිශ්චිත ව හඳුනාගෙන නැත.

මෙහි දී විද්වතුන් ගේ අවධානය යොමු විය යුතු සුවිශේෂ කරුණක් වන්නේ මහාවාලුකා නදියත් මාදුරු ඔයත් අතර වූ භූමි ප්‍රදේශය ඓතිහාසික යුගයේ දී අන්තරගංගා / අතරගඟ, දො ගඟ අතරහි / (ද්වින්නං ගංගානාං අන්තරේ)යි වංස කථාවලත් ශිලා

ලේඛනවලත් සඳහන් වීම යි.[6] මෙහි අන්තරගංගා (අතරගග) නම් 'ගංගානාං අන්තරේ' යි විග්‍රහ වෙයි. එනම් ගංගා අතර පිහිටි භූමි ප්‍රදේශය යි. එය වඩාත් නිවැරදි ව හඳුන්වා ඇත්තේ ''දො ගග අතරහි'' යන වහරෙනි. එනම් ගංගාවල් දෙකක් අතර / ද්වින්නං ගංගානාං අන්තරේ යන්නෙනි. මහවැලි ගඟත් මාදුරු ඔයත් අතර වන භූමි ප්‍රදේශයෙහි පිහිටි විල, අරලගංවිල - යන වර්තමාන ප්‍රදේශීය නාමයෙහි පවා මේ 'අන්තරා (ගංගා) සොබ්භස අතරගගවිල ස අතරගංවිල ස අරලංගවිල යි විපරිණාමයට පත්ව මේ පෞරාණික අන්තරගංගා යන්න අද දක්වාත් එකී වහරෙහි රැඳී තිබෙනු පෙනේ. ආරම්භයේ දී මාදුරු ඔයෙන් දියවර ලැබූ සේ පෙනෙන, ස්වාභාවික විලක් ව පැවැති අරලගංවිල වත්මනේ දී, ප්‍රදේශීය ජනතාව විසින් හඳුන්වනු ලබන්නේ අරලගංවිල වැව යනුවෙනි. ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සඳහා මේ විලෙන් / වැවෙන් දියවර සැපයේ. මේ ව්‍යවහාරයන්ගෙන් විශද වන්නේ මහවැලි ගඟ පමණක් නොව ඔයක් (ස්‍රෝතස් ස සොත ස හොත ස ඔය) වූ මාදුරු ඔය ද ගංගා ශබ්දයෙන් මෙහිදී ගැනුණු බව ය. මේ ගංගා දෙකින් මතු නොව මුළු ලක්දිව දිගම ගඟ මහවැලි නදිය වේ. එහෙයින් එය 'මහා ගංගා' නම ලැබීමට උචිත ය. එය ඓතිහාසික රජ රටත් රුහුණු රටත් එකිනෙක වෙන් වුණු එක් මහා මායිමකි. මහවැලි ගඟේ වම් ඉවුර රජ රටටත් එහි දකුණු ඉවුර රුහුණු රටටත් අයත් විය. මාදුරු ඔය පිහිටියේ නිසැක ලෙසම ඓතිහාසික රුහුණු රටෙහි ය. මාදුරු ඔය, මෙහි 'ගංගා' යන්නෙන් ගැනුණු බව පිළිගැනීම සුදුසු වෙයි. එහි 'ගංගා' ශබ්දයට ආදියෙහි කිසිදු විශේෂණයක් නො වී ය. උචිත වූ විශේෂණය - මහා - යන්න යෙදීමෙන් ගංගා යන්නෙන් වාච්‍ය වූ මාදුරු ඔයෙන්, මහවැලි නදිය 'මහා ගංගා' යි පෙර දවස වෙන් කොට හඳුනා ගනු ලැබිණ.

'ගංගා' යන්නෙන් මාදුරු ඔය ගැනුණු බව වඩාත් නිවැරදි ව තහවුරු කෙරෙන සාධකයක් පාළි නලාටධාතුවංසයෙන් හමු වේ. එනම් කතරගම දසභාතික රජ දරුවන් මරවා රෝහණයේ සමස්ත පාලනය ප්‍රචණ්ඩත්වයෙන් සිය අණසකට නතු කොට ගත් ක්‍රි.පූ. දෙවන ශතකයේ ගොඨාභය රජුට එකී මහා ඝාතනය නිසා මහජනතාවගෙන් එල්ල වූ විරෝධයෙන් / සාපයෙන් නිදහස් වීමට දඬුවමක් ලෙසින් එ රජු විසින් ගංගාවේ එගොඩ තීරයේත් මෙගොඩ තීරයේත් විහාර පන්සීය ගණනේ විහාර එක්දහසක් ගොඩ නැගූ බව නලාටධාතුවංසයේ සඳහන් ය.[7] මෙහි 'ගංගා' යන්නෙන් අදහස් වූයේ මාදුරු ඔය විනා මහවැලි ගඟ නම් නො විය යුතු ය. කුමක් හෙයින් ද යත් රෝහණයේ එකී ගෝඨාභය රජුට මහවැලි ගඟේ එගොඩ තීරයේ හෙවත් එහි වම් ඉවුරේ, තමන් විසින් විහාර කරවීමට බලයක් එහි නොවූ නිසා ය. හේතුව නම් මහවැලි ගඟේ එගොඩ තීරය - වම් ඉවුර - එකල අයත් වූයේ රජරට පාලනය ගෙන ගිය එළාර රජුට ය. එළාර රජු ගේ හමුදා සේනාංක විසින් එකී දේශ සීමාව ආරක්ෂා කරනු ලැබීය. එය පිහිටි රටේ - රජ රටේ නැගෙනහිර සීමාව ද විය. එකී ප්‍රදේශය, කතරගම දසභාතික රජුන්ගේ පාලන ප්‍රදේශයක් ද නොවී ය. එහෙයින් එකී කතරගම රජුන් මරවා ඒ රජ දරුවන් ගේ පාලන ප්‍රදේශයක් ද නොවූ බිම් තීරයක ඔවුන් වෙනුවෙන් විහාර ගොඩනැංවීම අපේක්ෂා කළ හැක්කක් නොවෙයි. එසේ ඝාතනයට ලක්වූ කතරගම රජ දරුවන්ගේ පැතුරුණු බලය සහිත එක් සුවිශේෂ ප්‍රදේශයක් නම් වර්තමාන මඩකලපු දිස්ත්‍රික්කයයි.[8] එහෙයින් යථෝක්ත ගෝඨාභය රජුන් එකී විහාර එක් දහස ගොඩනගන්නට අත්තේ රුහුණු රටට අයත් මහවැලි ගඟේ දකුණු ඉවුරු ප්‍රදේශයේ පිහිටි

මාදුරු ඔයේ උභය තීරයෙහි බව නිගමනය කළ හැකිය. මේ අනුව පූගලු තිස්ස මහරහතුන් ගේ විහාරය වූ පූව පබ්බතය පිහිටියේ අදාළ කථා වස්තුවේ සඳහන් වූ 'ගංගා' එනම් මාදුරු ඔයේ තීරයෙහි - වඩාත් නිවැරදි ව දක්වන්නේ නම් මාදුරු ඔයේ දකුණු තීරයේ - බව ය. මාදුරු ඔයේ දකුණු ඉවුරට නැගෙනහිරින් කි.මී. 17 ක් (සැතපුම් 09) ක් පමණ ඍජු දුරින් තොප්පිගල පිහිටි බව මෙහි පෙර සඳහන් විය.

තවද තොප්පිගල සිසාරා ගලා බස්නා ඇළ, අතු ගංගා සහ ගංගා අද ද පවතින බව පෙර මෙහි සඳහන් කෙරිණ. පූව පබ්බතය පිහිටියේ 'ගංගා තීරේ'යි සඳහන් වූයේ ඒ නිසා යැයි ද කෙනෙකුට සිතිය හැකි ය.

මේ සාධක අනුව එළඹිය හැකි නිගමනය වන්නේ තොප්පිගල ඓතිහාසික නාමය පූවපබ්බතය - පූවගාලකය - පූවගල්ලකය - පූගල වන බවයි. එහි වූ විහාරය පූවපබ්බත විහාර - පූවගාලක විහාර - පූවගල්ලක විහාර - පූගලු වෙහෙර නම් විය. මෙම පූගලු වෙහෙර, තොප්පිගල පර්වතයේත් එහි පර්වත පාදයෙහි වූ තැනිතලාවේත් නිසැක ව පැතිරී තිබෙන්නට ඇත.

මේ ඉපැරණි විහාරය කවර නම් කාලවකවනුවක කවර නම් කෙනෙකුන් විසින් ඉදිකරන ලද දැයි විමසා බැලීම වටනේය. තොප්පිගල පර්වතයේ විසිරී ඇති ශිලා නෂ්ටාවශේෂ අතර, කැටයම් කිසිවක් නැති ඉතා සරල අර්ධ චන්ද්‍ර පාෂාණයකි. මේ ස්වරූපයේ සඳකඩ පහණවල නිර්මාණ සමය ක්‍රි.පූ. යුගයට අයත් ය. එහෙයින් තොප්පිගල විහාරය - පූගලු වෙහෙර - නිසැකව ම ක්‍රි.පූ. කාල පරිච්ඡේදයේ ගොඩනැංවුණු ආරාමයකි. මෙ පරිදි පුරාවිද්‍යාත්මක මූර්තියකින් තහවුරු වන මේ විහාරයේ ක්‍රි.පූ. සමයේ නිර්මාණ සමය, සාහිත්‍ය මූලාශ්‍රයයන් ගෙන් ද තහවුරු වේ. සීහළවත්ථුප්පකරණයේ සඳහන් වන මනෝරමමංස (මයූරමංස?) තෙරුන් ගේ කථා වස්තුව,[9], සහස්සවත්ථුප්පකරණයේ ද රසවාහිනියේ ද සද්ධර්මාලංකාරයේ ද සඳහන් වන පූවපබ්බතවිහාරවාසී තිස්සත්ථේර කථා වස්තුව - පූගලු තිස්ස තෙරුන්ගේ කථා වස්තුව - යන කථා වස්තු සමග සැසඳීමේදී සීහළවත්ථුප්පකරණයෙහි එන මනෝරමමංස තෙරුන්ගේ කථාවස්තුවෙහි යම් යම් වෙනස්කම් පැවතිය ද එහි සමාන ස්ථාන ගණනාවක් දක්නට ලැබේ. එහෙයින් අනෙක් අදාළ ග්‍රන්ථත්‍රයයෙහි සඳහන් පූගලුවැසි තිස්ස තෙරුන් ගේ කථාවස්තුව වෙනත් ආකාරයකින් සීහළවත්ථුප්පකරණය වාර්තා කරන බව පෙනේ. එය එසේ සැලකිය හැකි නම්, සීහළවත්ථුප්පකරණයේ සඳහන් මනෝරමමංස තෙරුන් ගේ ධරමාන සමය, තිස්ස රජුන් ගේ - සද්ධාතිස්ස රජුන් ගේ - රාජ්‍ය කාලයට - ක්‍රි.පූ. 137 - 119 අයත්වන බවට පොල්වත්තේ බුද්ධදත්ත නාහිමිපාණන් විසින් කෙරෙන නිගමනයට[10] අනුව යටත් පිරිසෙයින් පූගලු විහරයේ නිර්මාණ සමය ක්‍රි.පූ. දෙවන ශතකයට අයත් වෙයි. එය, දිගාමඩුල්ලේ - වත්මන් අම්පාර බද ප්‍රදේශයේ - පටන් අනුරාධපුරය තෙක් යොදුනක් යොදුනක් පාසා සද්ධාතිස්ස රජුන් විසින් ගොඩනංවන ලද්දේ යැයි වංසකථාවල සඳහන් විහාරාරාමයන්ගෙන් එක් විහාරාරාමයක් වීමට ද අවකාශ ඇත. තවද ඒ පූගලු වෙහෙර, කතරගම දසබෑ රජුන් මරවා එයට දඬුවම් පිණිස, කාවන්තිස්ස රජුන්ගේ පියා වූ ගෝඨාභය රජුන් (ක්‍රි.පූ. දෙවන ශතකය)

විසින් ගංගාවේ - මාදුරුඔයේ - උභය තීරයෙහි ගොඩ නැගූ විහාර එක් දහසින් එකක් වීමට ද හැකිය. මෙ පරිදි කවර ආකාරයකින් එහි නිර්මාණ සමයට අදාළ සාධක පිරික්සද්දී හැඟී යන්නේ පූගලු වෙහෙර, ශ්‍රී ලංකා ද්වීපයට බුදුසමය හඳුන්වා දෙනු ලැබූ ක්‍රි.පූ. තුන්වන ශතකය දක්වා වුව ද ඈතට ගමන් කරන බව යි.

තොප්පිගල උදෙසා ඓතිහාසික යුගයේ දී ව්‍යවහාර ප්‍රාප්ත පූපපර්වත, පූවපබ්බත, පූවගල්ලක, පූවගාලක, පූගල යන යෙදුම්වලින් විශේෂයෙන් 'පූවගාලක' යන්නෙන් විපරිණාමයට පත් වූ නාමයක්, තොප්පිගලින් කි.මී. 07 ක් (සැතපුම් 04 ක්) පමණ ඍජු දුර වයඹ දිගින් පිහිටි නෙලුගල නම් පැතුරුණු ගල් පර්වතයේ එක දිගට පිහිටි ගල් ලෙන් සතරක් (04), ඉපැරණි දාගැබ් පහක් (05), සුවිසල් ගල් වජ්‍රාසනයක්, නටබුන් ගොඩනැගිලි සමූහයක් සහිත සුවිසල් බෞද්ධ ආරාමයෙහි ක්‍රි.ව. 141 - 165 කාලයට නිසැකව අයත් වන ප්‍රාකෘත සිංහල භාෂාවෙන් ලියැවුණු ඉපැරණි දීර්ඝතම සෙල්ලිපියෙහි[11] සඳහන් ය. දීර්ඝ වූ මේ ශිලා ලේඛනයේ අදාළ කරුණට යොමු වූ කොටස ද සංක්ෂිප්ත කොට මෙසේ සැකෙවින් දක්වනු ලැබේ.

''සිධ. අමෙතය අසගිරයහ පුත අමෙතය අහලය <u>පයගලක</u> අහලිපවත වහර අකිත සග අරබ කරවය... <u>පයගලක</u> අහලිපවත විහරෙ.... <u>පියගලක අහලිපවතෙ විහරහි</u>.... <u>පියගලක අහලිපවතහි බු</u>කි සගහට... තිස මහ රජහ සෙනපති අහලය පියගලක අහලිපවත විහර අකිත... අහලිගම ච <u>අහලිපවත විහරහි</u> දිනි''

මෙහි නූතන සිංහල අනුවාදය මෙසේ ය.

යහපතක් වේවා. අසගිරය අමාත්‍යවරයා ගේ පුත් වූ අමාත්‍ය අහලය විසින් <u>පයගලක ප්‍රදේශයේ</u> වූ අහලිපවත විහාර සංඛ්‍යාත සංඝාරාමය කරවා... <u>පයගලක</u> අහලිපවත විහාරයෙහි... <u>පියගලක</u> අහලිපවත විහාරයෙහි... <u>පියගලක</u> අහලිපවත විහාරයෙහි භික්ෂු සංඝයා වහන්සේට.... තිස්ස මහ රජු ගේ සේනාපති වූ අහලය, <u>පියගලක</u> අහලිපවත විහාර සංඛ්‍යාත... අහලි ග්‍රාමය ද අහලිපවත විහාරය විෂයයෙහි ප්‍රදානය කෙරිණ.

(යථෝක්ත සෙල්ලිපි පෙළෙහිත් එහි සිංහල අනුවාදයෙහිත් පයගලක/පියගලක නම් අංකිත කෙරිණ)

තොප්පිගල පිහිටි වත්මන් නෙලුගල ඉපැරණි විහාරයේ ඓතිහාසික නාමය මෙහි සඳහන් වන පරිදි ''අහලිපවත විහර'' යනු වේ. ඒ ඉපැරණි අහලිපවත විහාරය එකල පිහිටා තිබුණේ මේ සෙල්ලිපියේ සඳහන් වන ආකාරයට පයගලක/පියගලක යන නමින් හැඳින් වූ ඓතිහාසික භූමි ප්‍රදේශයෙහි ය. මේ පයගලක /පියගලක නාම පාළි භාෂාවට 'පියංගල්ල'යී අවතීර්ණ වීමටද අවකාශ නැත්තේ නොවේ. ඒ එසේ වුවත් එය ඊට වඩා වත්මන් තොප්පිගල ඓතිහාසිකව හැඳින් වූ නාමයන් අතර වූ පූගලක නාමයට වඩාත් සමීප වෙයි. පූගලක ස පුගලකස පයගලක /පියගලක යී, එය වෙනසකට - පරිණාමයට පත් වී යයි අපේක්ෂා කළ හැකිය. මේ සෙල්ලිපියේ සිංහල භාෂා ව්‍යවහාරයෙහි එ බඳු වූ වෙනත් ශබ්ද පරිණාමද ඇත.

''ඉසිගිරය'' නමැති අමාත්‍යවරයාගේ නාමය මේ සෙල්ලිපිය ''අසගිරය'' යනුවෙන් ද ''බිකු සගහ'' යන්න 'බුකුසගහ'යී ද යන යෙදුම්වලින් එය සුපැහැදිලි වෙයි. මේ පරිදි සිංහල භාෂා උච්චාරණයෙහි සුවිශේෂත්වයක් ක්‍රි.ව. දෙවන ශතකය තරමේ දී සිදු වුණු බව පෙනේ. මෙපරිදි නෙලුගල සෙල්ලිපියෙහි පයගලක/පියගලක නමින් ද හැඳින්වූයේ පූගලක යන්න බවත් ඉන් අදහස් වූයේ තොප්පිගල ප්‍රදේශය බවත් අදාළ ප්‍රදේශයෙන් සෙල්ලිපියකින් ම එය හමුවීම සුවිශේෂ වෙයි. තව ද එය තොප්පිගල ප්‍රදේශීය වත්මන් දමිළ බස් වහරෙහි ද සුරැකී තැන්පත් ව පවතිමින් සිටින බව පෙනේ. දැනට දමිළ සහෝදර ජනතාව වෙසෙන ප්‍රදේශයක් වූ තොප්පිගල පිහිටියේ ''පිරිල්ලවේලි'' ග්‍රාමසේවා වසමෙහි ය. ''පිරිල්ලවේලි'' යන දමිළ උච්චාරණයෙහි, පූවපබ්බත(ගාම)/පූවගල්ලක(ගාම)/පූගලක(ගාම)/පූගලු(ගම) යන්න වසර දෙදහස් ගණනාවක් පුරා පැමිණ කට වහරින් විපරිණාමයට පැමිණ තැන්පත්ව පවතින බව පෙනේ. එය පූවගල්ලක ස පූවගල්ල ස පයගලක ස පියගලක ස පියගල්ල ස පියකල්ල ස පියහල්ල ස පියල්ල ස පියිල්ල ස පිරිල්ල යි ශබ්ද පරිණාමයට පත්ව වත්මන් දෙමළ වහරින් මෙසේ විපරිණාමයට පත් වූ වග පෙනේ. මේ සාධක අනුව නූතන තොප්පිගල ඓතිහාසිකව අවම වශයෙන් වසර දෙදහස් තුන්සීයක් පමණ වූ දීර්ඝ කාලයක් පුරා පූපපර්වත ස පූවපබ්බත ස පූවගල්ලකස පූගල්ලකස පූගලක ස පූගලු ස පයගලක ස පියගලක ස පියගල්ල ස පියකල්ල ස පියහල්ල ස පියල්ල සපියිල්ල ස පිරිල්ල යි යන නම්වලින් යුගයෙන් යුගයෙහි හැඳින්වුණු බවත් පූගලු වෙහෙර වැසි යථෝක්ත තිස්ස මහ රහතුන්ගේ සුවිශේෂ වූ චරිතාපදානය හේතුවෙන් එය සමස්ත ශ්‍රී ලංකාද්වීපවාසීන් ගේ මහත් අවධානයට පත් වූ බවත් නිගමනය කළ හැකි ය.

පූගලු වෙහෙර වැසි තිස්ස මහ තෙරුන්ගේ නම - 'පුවගුක තිස' - නම් තබා ක්‍රි.ව. පළමුවන සියවසෙහි ඉසිගිරි ඇමතිතුමන් විසින් නාගදීපයේ (යාපනයේ අර්ධද්වීපයේ) විහාරයක් කළ බවට සාධක අනාවරණය විය. නෙලුගල සෙල්ලිපියේ (ක්‍රි.ව. 141-165) සඳහන් වුණු අසගිර ඇමති නමදඑහිම පයගලක/පියගලක ප්‍රදේශ නම ද සුප්‍රසිද්ධ වල්ලිපුරම් රන් සන්නසේ[12](ක්‍රි.ව. 67-111) සඳහන් වුණු ඉසිගිර ඇමති නම ද එක් ඇමතිවරයකු ලෙස හැඳින ගැනීමට හැකි, ඉසිගිර/අසගිර අමාත්‍යවරයාගේ ජීවමාන සමය, වල්ලිපුරම් රන් සන්නස හා නෙලුගල සෙල්ලිපිය අනුව ක්‍රි.ව. 67-111; ක්‍රි.ව. 141-165 + ක්‍රි.ව. 67 - 165 කාල පරාසය, උපරිම වශයෙන් අවුරුදු 98 ක කාල පරිච්ඡේදයක් වීම ද සීහළවත්ථුප්පකරණය, සහස්සවත්ථුප්පකරණය, රසවාහිනිය, සද්ධර්මාලංකාරය යන සම්භාව්‍ය පාළි සිංහල සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් පූවපබ්බත/පූවගල්ලක/පූගලක/පූගල නාම ද පූගලු වෙහෙර වැසි තිස්ස මහ රහතුන්ගේ නාමය තිස ද යන මේ සංඥානාම සියල්ලක් එකට ගත් කල ඒවා සියල්ලක් අපූර්වාකාරයෙන් සමාසන්නව සැසැඳී (ඉසිගිර/අසගිර ඍෂිගිර ඉසිගිර අසගිර පූවපබ්බත/පූවගල්ලක/පූගලක/පූගල/පයගලක/පියගලක/පියගුක, තිස්ස (ත්ථෙර)/තිස (පියගුක තිස) තුලනය වීමෙන් නිගමනය වන්නේ, පූගල-තොප්පිගල - උපත ලත් ඉසිගිර /අසගිර ඇමතිවරයා විසින් තමා නාගදීපය-යාපනය අර්ධද්වීපය - වසභ රජු (ක්‍රි.ව. 67-111)යටතේ පාලනය කරමින් සිටිය දී සිය උපන් බිමේ පූගල - තොප්පිගල - ක්‍රි.පූ. දෙවන සියවසේ ඉපිද මුළු ලක් දෙරණ ම බබුළුවා වැඩ විසූ තිස්ස මහ රහතුන්ගේ නම - පූගල්ලක විහාරවාසී තිස්ස - පියගුක තිස - නම් තබා උන්වහන්සේගේ අසිරිමත් චරිතාපදානය

ජාත්‍යන්තර නාවික වාණිජ ප්‍රජාව ගේ මාර්ගයෙන් එවක පැවති සේද මාවත ඔස්සේ ප්‍රචාරය වීමට සලස්වා, වසරක් පාසා දහස් ගණනක් තිරිසන් සතුන් ගේ බෙලි කපා ඉන් ගලා ගිය රුධිර ධාරායෙන් දෙවියන්ට බිලි පූජා පවත්වා දෙවියන් සතුටු කොට සිය අර්ථ සිද්ධිය මුළා ලෙස පැතු, මහා භාරතය ප්‍රමුඛ ජාත්‍යන්තර ලෝක ප්‍රජාවගේ සිත්, තිරිසන් සතුන් කෙරෙහි කරුණාව දයාව බුද්ධිමත් ව අවංකව දක්වීමට යොමු කරනු පිණිස නාගදීපයේ - යාපනය අර්ධද්වීපයේ හල්ලතීර්ථ පට්ටනයේ - පේදුරු තුඩුව අසල වඩමාරච්චි වල්ලිපුරම්හි - ඓතිහාසික වරායේ 'පියගුක තිස වෙහෙර' ඉදි කළ වග ය. මේ හල්ලතීර්ථ පට්ටනය වූ කලී ශ්‍රී ලංකාව හා නැගෙනහිර මහා භාරතය අතර සිදු කළ ජාත්‍යන්තර නාවික ගමනාගමනයේ ඍජු මාවතේ පිහිටියකි. අනුරාධපුර අභයගිරි විහාරයේ සංඝස්ථවිරයන් වහන්සේගේ උපදෙස් පරිදි සීගිරි කාශ්‍යප මහ රජුන් විසින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වාණිජ ලෝකයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය බවට අනුවර්තනය කර ගැනීමට, නාවික බඳුවලින් මුළුමනින්ම නිදහස් කළ ලංකාවේ වරාය තුනෙන් - කැලණිය (කොළඹ), හල්ලතීර්ථ පට්ටන, මඩකලපුව/සම්මන්තුරේ - එකක් හල්ලතීර්ථ පට්ටනය වූ බව අන්තරාලීන ශිලා ලේඛනවල[13] සඳහන් ය.

වල්ලිපුරම් රන් සන්නසේ 'පියගුක තිස වෙහෙර' යන යෙදුම වත්මන් සිංහලයට නැඟීමේදී ගැටලු මතු වී ඇත. එහෙයින් ඒ අභිලේඛනය දක්වා එකී ගැටලුව නිරාකරණය කරනු වස් ඒ ලිපිය මෙහි දැන්වීමට අපේක්ෂා කෙරේ. එය මෙසේය.

1. සිධ. මහරජ වහයහ රජහි අමෙතෙ
2. ඉසිගිරයෙ නකදිව බුජමෙනි
3. බදකර - අතනෙහි පියගුක - තිස
4. විහර කරිතෙ[14]

මේ අභිලේඛනයට ප්‍රමුඛ අර්ථයක් ද අතිරේක අර්ථයක් දැයි අර්ථ දෙකක් මහාචාර්ය පරණවිතාන මහතා දක්වයි. ඒවා මෙසේ ය.

**ප්‍රමුඛ අර්ථය**

''යහපතක් වේවා. වසභ මහ රජු ගේ පාලන සමයෙහි ඉසිගිරය ඇමතිවරයා (විසින්) නාගදීපය (යාපනය අර්ධද්වීපය) පාලනය කරද්දී (එහි) බදකර අතනෙහි පියගුහ තිස්ස නමැත්තා විහාරයක් ඉදි කෙළේ ය.''

**අතිරේක අර්ථය**

''යහපතක් වේවා. වසභ මහ රජු ගේ පාලන සමයෙහි, නාගදීපය (යාපනය අර්ධද්වීපය) පාලනය කළ ඉසිගිරය ඇමතිවරයා, (එහි) බදකර අතනෙහි පියගුක තිස්ස (නමින් වූ) විහාරය ඉදි කෙළේය''

මෙහි ප්‍රමුඛ අර්ථ කථනයෙහි විද්‍යාමාන වන ප්‍රධාන දෝෂය නම් අත්‍යවශ්‍ය වූ ම විහාර නාමය එහි අවිද්‍යාමාන වීම ය. එය විය නො හැකිය. එහෙත් අතිරේක අර්ථ කථනයෙහි විහාර නාමය පැහැදිලි ව 'පියගුක තිස විහර' යි දැක්වේ. මේ අතිරේක අර්ථ කථනය නිරවද්‍ය

බව මඩකලපු දිස්ත්‍රික්කයේ එරාවුර් පත්තුවේ කාසිමොට්ටයි, කනියම් කුඩමලේ ගිරි ලිපියේ එන

''සිද්ධම්. මහරජ වහබයහ මහරටිය චුළ රොහණ බොජික අමතිය හොණයහ පුත අමති දෙව නකය පජිනිකර බුජමිනි [පජිනිකර විහර]කනි මහ තුබෙ කරවය....''[15]

එහි නූතන සිංහල අනුවදාය මෙ පරිදි ය.

''යහපතක් වේවා. වසභ මහ රජු ගේ (ක්‍රි.ව. 67-111) දේශ සීමා පිළිබඳ ප්‍රධාන නිලධාරි වූ ද රෝහණයේ නියෝජ්‍ය ආණ්ඩුකාර වූ ද අමාත්‍ය ස්වර්ණ ගේ පුත් වූ නැගෙනහිර මුහුදුකරය පාලනය කරන අමාත්‍ය දේව නාග තෙමේ [පජිනිකර විහාරයේ] මහා ථූපය කරවා....''

මේ ඡේදය වල්ලිපුරම් රන් සන්නසේ අභිලේඛනයේ එන පාඨ සහ සැසඳීමේදී පැහැදිලි වන්නේ වල්ලිපුරම් රන් සන්නසට මහාචාර්ය පරණවිතාන සූරීන් විසින් දක් වූ ප්‍රමුඛ අර්ථකථනයට වඩා එහි අතිරේක අර්ථකථනය ශාස්ත්‍ර යුක්තියෙහි පිහිටා ඇති වගය.

මෙ පරිදි ඓතිහාසික පූගලු - තොප්පිගල - වෙහෙර ද ක්‍රි.පූ. දෙවන සියවසේ එහි වැඩ විසූ තිස්ස මහ රහතුන් ගේ අසිරිමත්, පෙර නොවූ විරූ, චරිතාපදානය ද මුළු මහත් ලක්දිව ද ලොව බොහෝ රටවල ද චිරාත් කාලයක් සුපතළ ව පවතින්නට ඇත.

**පාදක සටහන්**

1 මේධානන්ද ස්ථවිර, එල්ලාවල, කුඩිම්බිගල තපෝවනය, සපරගමු ඉතිහාස පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය, 1980, පිටු 60-61.

2 සීහළවත්ථුප්පකරණ (සං) බුද්ධදත්ත ස්ථවිර, පොල්වත්තේ, කොළඹ 1959 (කෙටි කිරීමඃසීව) පිටු. 17-19; සහස්සවත්ථුප්පකරණ (සං.) බුද්ධදත්ත ස්ථවිර, පොල්වත්තේ, කොළඹ, 1959, පිටු. 42-44; රසවාහිනී (සං.) පණ්ඩිත ඤාණවිමල හිමි, කිරිඇල්ලේ, කොළඹ, 1961, පිටු. 130-133. සද්ධර්මාලංකාරය (සං.) ආචාර්ය පඤ්ඤාලෝක හිමි, මීගොඩ, දෙහිවල, 1997, (කෙටි කිරීමඃසද්ලං) පිටු, 495-500.

3 Nicholes, C.W.; J.R.A.S. (C.B.) (N. S.) SPN. Vol. vi, p. 196.

4 ජාතකට්ඨකථා VI (සං), පියතිස්ස මහ නාහිමි, විදුරුපොළ, ත්‍රිපිටක මුද්‍රණ, කොළඹ, බු.ව. 2481, පිටු. 148, 149, 152; සිතුවම් සහිත පන්සියපණස් ජාතක පොත් වහන්සේ, උපදේශාත්මක අධීක්ෂණය, ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය චන්ද්‍රිම හිමි වත්තේවැවේ, කොළඹ (දෙවන මුද්‍රණය) 2007, පිටු, 1421, 1422; සිතියම් සහිත කුස ජාතක කාව්‍යය, (සං.) සමරසිංහ, ඩී.එම්. කොළඹ, 1964, පද්‍ය අංක 293, 318, 335-340, 349, 350, 355, 439.

5 Nicholas, C.W.; J.R.A.S. (C.B.) (N.S.) SPN. Vol. VI, p. 33.

6 Inscriptions of Ceylon, Vol. II, Part II, pp. 133,135.

7 සිංහල ධාතුවංශය (සං) විමල් විජේරත්න, එම්. ඩබ්ලිව්.; මරදාන, 2012, පිටුව 712.

8 Nicholas, C.W.; J.R.A.S. (C.B.) (N.S.) SPN. Vol. VI, p. 51.

9 සීව. පිටු. 17-19.

10 ඉතා පැරණි සිංහල බණකතා, (සීහළවත්ථුප්පකරණයේ සිංහල අනුවාදය) අනුවාදක අග්ගමහාපණ්ඩිත බුද්ධදත්ත, පොල්වත්තේ, මරදාන, 1958, පිටු. 07, 14-16; සස.

''ඉති නරනරාසහස්ස තිස්සරඤ්ඤෝ
තුසිතපුරම්හි ගතස්ස අමච්චසෙට්ඨො,

ඉධ බහූ කුසලානි සංචයිත්වා
තුසිතපුරවරමේව ගතොචවිත්වා'' සව. පිටුව 19; සද්ලං.පිට. 500, අධෝලිපිය†

11 Inscription of Ceylon, Vol. II, Part I, pp. 79-81.

12 Inscription of Ceylon, Vol. II, Part I. pp. 73-75.

13 Paranavitana, S. The Story of Sigiri, pp. 66-67 f 54-55.

14 Inscriptions of Ceylon, Vol. II, Part I, pp. 79-81; See foot Note No. 7, p. 81.

15 Inscriptions of Ceylon, Vol. II, Part I, pp. 73-75.

තොප්පිගල ගවේෂණය සඳහා පහත සඳහන් කෙරෙන භවතුන්ගේ සහායය කෘතවේදීව සඳහන් කෙරේ.

1. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් සෙනරත් දිසානායක මහතා ප්‍රමුඛ එහි අදාළ කාර්ය මණ්ඩලය - ගවේෂණයට අනුමැතිය දීම.

2. බ්‍රිගේඩියර් කොඩිප්පිලි මහතා, සේනාංකාධිපතිතුමා 23 සේනාංකය.

3. කර්නල් රවීන්ද්‍ර ඩයස් මහතා, බලසේනාධිපති, 232 බලසේනාව, තොප්පිගල.

4. බලසේනා මේජර්, මේජර් කුමාරසිරි මහතා.

5. මේජර් සමන්ත අමරතුංග මහතා, 232 බලසේනාවේ සම්බන්ධීකරණ නිලධාරී.

6. මේජර් නවරත්න මහතා, 232 සේනාංකයේ මේජර් (පාලන)

7. කැප්ටන් වේරගොඩ මහතා.

8. මේජර් උපාලි රත්නායක මහතා, 12 වන කාලතුවක්කු රෙජිමේන්තුවේ මේජර්.

   යුද්ධ හමුදාවේ මේ නිලධාරීන් දැක්වූ සහයෝගය හා මඟපෙන්වීම නොවන්නට මේ පර්යේෂණ සිදුවන්නේ නැත.

9. ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ අධිපති මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් මහත්මියට, තොප්පිගල සිතියම් ඇඳ සකස් කොට දුන් ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ භූගෝල විද්‍යාව අධ්‍යයනාංශයේ නිබන්ධක ඩබ්.ජී. ඉෂාර සුපුන් චන්දන මහතාට

10. තොප්පිගල සඤ්චාරයට නන් අයුරින් උපකාර වෙමින් සහභාගි වූ එන්. අයි. සමරතුංග මහතාට හා එම මහත්මියට.

11. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශිලාලේඛන නිලධාරී ධම්මිකා ප්‍රියදර්ශනී මෙණෙවියට.

12. ලක්ෂාන් රන්දික ගලගම ආරච්චි මහතා ප්‍රමුඛ ඥාතීන්

13. ඒ. ජී. විජේරත්න මහත්මිය යන සියලු දෙනාට මේ සඳහා දැක්වූ සහයෝගයට කෘතඥතාව පළ කෙරේ.

14. මෙම ශාස්ත්‍රීය ලිපියේ වර්ණ සංයෝජනය කළ කුමාරි විජේවර්ධන මහත්මියට අප ගේ ප්‍රශංසාව හිමි විය යුතු ය.